සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

අ.පො.ස (සා.පෙළ) විභාගය- 2023 (2024)

පෙරහුරු පරීක්ෂණය- පුරවැසි අධ්‍යාපනය i, ii

කාලය පැය 3 මිනිත්ත 10

# පුරවැසි අධ්‍යාපනය I

සැලකිය යුතුයි :

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.

01. ප්‍රජාතන්ත්‍රවාදය වැදගත් වන ආකාරය කොටස් දෙකකට බෙදේ. ඉන් එකක් පාලන ක්‍රමයක් ලෙසය. අනෙක් කොටස වන්නේ,
(1) නියෝජන ක්‍රමයන් (2) ඍජු උපක්‍රමයන්
(3) ජීවන ක්‍රමයන් (4) නිවැරදි උප ක්‍රමයන්

02. ඒක පක්ෂ ක්‍රමයක් ඇති රටවල් දෙකක් නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) ශ්‍රී ලංකාව, මැලේසියාව (2) ඇමෙරිකාව , ඉන්දියාව
(1) චීනය, කියුබාව (4) ප්‍රංශය, පකිස්ථානය

03. ප්‍රජතන්ත්‍රවාදී සමාජයක පුරවැසියෙකු විසින් ඉටුකළ යුතු නීතිමය යුතුකම් ඇතුලත් පිළිතුර තෝරන්න.
(1) විශේෂ අවශ්‍යතා ඇති අයට උදව් කිරීම.
(2) පොදු දේපල ආරක්ෂා කිරීම.
(3) ගුරුවරුන්ට ගරු කිරීම.
(4) සිරිත් විරිත් හා සම්ප්‍රදාය ගරු කිරීම.

04. රාජ්‍යය සතු උත්තරීතර බලය වන්නේ,
(1) පරමාධිපත්‍ය බලය (2) ස්වාධිපති බලය
(3) නීතියේ ආධිපත්‍ය (4) ප්‍රජාතන්ත්‍රවාදය

05. පරමාධිපත්‍යය බලයට අයත් නොවන්නේ
(1) අධිකරණ බලය (2) පාලන බලතල
(3) ඡන්ද බලය (4) මූලික අයිතිවාසිකම්

06. ආණ්ඩුවල ප්‍රධාන ස්වරූප දෙක තෝරන්න.
(1) ඒකීය හා සන්ධීය ආණ්ඩු (2) ජනාධිපති හා පාර්ලිමේන්තු ආණ්ඩු
(3) ජාතික හා ප්‍රාදේශීය ආණ්ඩු (4) ඒකාධිපති හා ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු

07. නිදහස් ශ්‍රී ලංකාවේ පරිපාලන ක්‍රමය විමද්‍යගත කිරීමට පළමු වරට දරනලද ප්‍රයත්නය වන්නේ,
(1) අයවැය විමද්‍යගත කිරීම (2) දේශපාලන අධිකාරී ක්‍රමය ඇති කිරීම
(3) දිසා ඇමතික්‍රමය ඇති කිරීම (4) දිස්ත්‍රික් සංවර්ධන සභා පිහිටුවීම

**08.** **ශ්‍රී ලංකාවේ මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභා වලට සමසේ භුක්ති විඳිය හැකි බලතල සහිත ලැයිස්තුවක් වන්නේ,**

| | | | |
|---|---|---|---|
| (1) | සමගාමී ලැයිස්තුව | (2) | පළාත්සභා ලැයිස්තුව |
| (3) | සංවෘත ලැයිස්තුව | (4) | පළාත් පාලන ලැයිස්තුව |

**09.** **මැතිවරණ කොට්ඨාශවලට බෙදා වෙන් කිරීමේදී සැලකිල්ලට ගනු ලබන ප්‍රධාන නිර්ණායක ඇතුලත් පිළිතුර තෝරන්න.**

| | | | |
|---|---|---|---|
| (1) | භූමිය, ඡන්ද සංඛ්‍යාව | (2) | භූමිය, ජන සංයුතිය |
| (3) | ජන සංයුතිය, ජන අනුපාතය | (4) | භූමිය, ජනග්‍රහණය |

**10.** **වර්තමානයේ පළාත් පාලන ආයතනයක් ලෙස හඳුන්වන්නේ,**

| | | | |
|---|---|---|---|
| (1) | සුළු නගර සභා | (2) | ගම් කාර්ය සභා |
| (3) | ප්‍රාදේශීය සභා | (4) | පළාත් සභා |

**11.** **ප්‍රාග්ධන සූක්ෂම ශිල්පීය ක්‍රම භාවිතය යනුවෙන් අදහස් කරනුයේ,**

(1) භාණ්ඩ බෙදා හැරීමේදී යාන්ත්‍රික ක්‍රමය බහුලව යොදා ගනී.
(2) භාණ්ඩ නිෂ්පාදනයේදී මිනිස් ශ්‍රමය බහුලව යොදා ගනී.
(3) භාණ්ඩ ප්‍රවාහනය සඳහා විවිධ තාක්ෂණික උපක්‍රම භාවිතා කිරීම.
(4) භාණ්ඩ නිෂ්පාදනයේදී වැඩිපුර යන්ත්‍ර සූත්‍ර යොදා ගැනීම.

**12.** **දේපල අයිතිය රජය සතුවීම හා පොදු යහපත උදෙසා කටයුතු කරන ආර්ථික ක්‍රමය තෝරන්න.**

| | | | |
|---|---|---|---|
| (1) | සමාජවාදී ආර්ථික ක්‍රමය | (2) | ධනවාදී ආර්ථික ක්‍රමය |
| (3) | මිශ්‍ර ආර්ථික ක්‍රමය | (4) | වෙළඳපොල ආර්ථික ක්‍රමය |

**13.** **නිෂ්පාදන සාධකයක් වන්නේ මින් කුමක්ද?**

| | | | |
|---|---|---|---|
| (1) | බැංකු සේවය | (2) | විදේශාධාර |
| (3) | මූල්‍ය ණය පහසුකම් | (4) | ප්‍රාග්ධනය |

**14.** **මිනිසාගේ පැවැත්ම සඳහා අනිවාර්යයෙන් තිබිය යුතු දේවල් හඳුන්වන්නේ,**

| | | | |
|---|---|---|---|
| (1) | වුවමනා | (2) | ආශාවන් |
| (3) | අවශ්‍යතා | (4) | මේ කිසිවක් නොවේ |

**15.** **ස්විස්ටර්ලන්තය සන්ධීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කැන්ටන් සතු බලතල වලට අයත් විෂයක් වන්නේ,**

| | | | |
|---|---|---|---|
| (1) | විදේශ කටයුතු | (2) | අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන |
| (3) | ආරක්ෂක හා හමුදා කටයුතු | (4) | පණිවිඩ හුවමාරුව |

**16.** **ශ්‍රී ලංකාවට ජනාධිපතිධූරය හඳුන්වා දෙනු ලැබුවේ.**

| | | | |
|---|---|---|---|
| (1) | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් | (2) | 1948 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් |
| (2) | 1931 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් | (4) | 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් |

**17.** **ජනවර්ග අතර, ආගම් අතර ඇතිවන ගැටුම් හඳුන්වන්නේ,**

| | | | |
|---|---|---|---|
| (1) | සූක්ෂම ගැටුම් | (2) | පවුලේ ගැටුම් |
| (3) | සාර්ව ගැටුම් | (4) | පුද්ගල ගැටුම් |

**18.** **පළාත් සභාවක ආණ්ඩුකාරවරයා පත් කරනු ලබන්නේ,**

| | | | |
|---|---|---|---|
| (1) | මහ ඇමතිවරුයා විසිනි | (2) | ජනාධිපතිවරයා විසිනි |
| (3) | අගමැතිවරයා විසිනි | (4) | පක්ෂනායකයා විසිනි |

**19.** **ගැටුම් නිරාකරණයේදී නීතිමය විසඳුමක් ලබාදීමේ ක්‍රියාවලිය හඳුන්වන්නේ,**

| | | | |
|---|---|---|---|
| (1) | විනිසීම | (2) | සාකච්චා ක්‍රමය |
| (3) | උපදේශනය | (4) | මැදිහත්කරණය |

**20.** **මිනිස් උවමනා හා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා යම් කිසි මිලක් ගෙවා ලබා ගන්නා භාණ්ඩ හඳුන්වන්නේ,**

(1) ප්‍රාග්ධන භාණ්ඩ (2) ආර්ථික භාණ්ඩ
(3) නිෂ්පාදන භාණ්ඩ (4) පරිභෝජන භාණ්ඩ

**21.** **තේසවලාමේ නීතිය අදාල වන්නේ,**

(1) මුළු දිවයිනටම (2) උඩරට ජන කොටස් සඳහා
(3) පහතරට ජන කොටස් සඳහා (4) උතුරු පළාතේ පදිංචි දෙමළ වැසියන් සඳහා

**22.** **මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අධිකරණය ලෙස ක්‍රියාත්මක වන්නේ,**

(1) ශ්‍රේෂ්ඨාධිකරණය (2) අභියාචනාධිකරණය
(3) මහාධිකරණය (4) පළාත්බද මහාධිකරණය

**23.** **ශ්‍රේෂ්ඨාධිකරණය සතු බලයක් වන්නේ,**

(1) පාර්ලිමේන්තු මැතිවරණ පෙත්සම් විභාග කිරීමේ බලය.
(2) පවුල් ආරවුල් විසඳීම
(3) ජනාධිපතිවරණ පෙත්සම් විභාග කිරීමේ බලය.
(4) වාණිජ ආරවුල් විසඳීම

**24.** **නීතියේ මූලාශ්‍රයක් නොවන්නේ,**

(1) ආගම (2) සිරිත් විරිත්
(3) පළාත් සභා අණ පනත් (4) අධිකරණ තීන්දු

**25.** **නීතිය පිළිබඳ නොගැලපෙන ප්‍රකාශය වන්නේ,**

(1) අධිකාරී බලය පදනම් කරගෙන රජය විසින් පනවයි.
(2) සමාජයේ පොදු යහපත පදනම්කරගෙන පනවයි.
(3) වෙනස්වන සමාජ අවශ්‍යතා අනුව වෙනස් වෙයි.
(4) පුද්ගලයාගේ අභ්‍යන්තර හා භාහිර හැසිරීම් පාලනය කිරීම අරමුණු කරගෙන පනවනු ලබයි.

**26.** **ළමා අයිතිවාසිකම් සම්මුතියට අනුව ළමයෙකු ලෙස සලකන්නේ,**

(1) වයස 16 ට අඩු අයෙකු (2) වයස 18 ට අඩු අයෙකු
(3) වයස 21 ට අඩු අයෙකු (4) වයස 12 ට අඩු අයෙකු

**27.** **එක්සත් ජාතීන්ගේ කාන්තා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය අත්සන් කළ වර්ෂය වන්නේ**

(1) 1948 (2) 1979 (3) 1989 (4) 1997

**28.** **සමස්ත ජාත්‍යන්තර ක්ෂේත්‍රයම ආවරණය වන පරිදි ගොඩනගා ඇති සංවිධානය වන්නේ,**

(1) පොදු රාජ්‍ය මණ්ඩලය (2) එක්සත් ජාතීන්ගේ සංවිධානය
(3) සාර්ක් සංවිධානය (4) නේටෝ සංවිධානය

**29.** **පරිසරයේ භෞතික සංරචක ලෙස සැලකිය නොහැකි ලක්ෂණය තෝරන්න.**

(1) පස (2) ජලය (3) සතුන් (4) වායුව

**30.** **විදේශ වෙළඳාම සම්බන්ධ ජාත්‍යන්තර සංවිධානයක් නොවන්නේ,**

(1) යුරෝපා පොදු වෙළඳ හවුල (2) උන්ක්ටාඩ් සංවිධානය
(3) ලෝක බැංකුව (4) ගැට් සංවිධානය

**31.** **සිවිල් හෝ අපරාධ නඩු වලදී රජය පාර්ශවය නියෝජනය කරන්නේ,**

(1) පොලිස්පති (2) හමුදාපති (3) නීතිපති (4) අග විනිසුරු

**32. තානාපතිවරයෙකු හෝ රාජ්‍ය දූතයෙකු තුල තිබිය යුතු ගුණාංගයක් වන්නේ,**

(1) රාජ්‍යයන් දෙක අතර මිත්‍රත්වය තහවුරු කිරීම.
(2) තම රටේ විදේශ ප්‍රතිපත්ති ක්‍රියාවේ යෙදවීම.
(3) තම රට පිළිබඳව හා තමා සේවය කරන රට පිළිබඳව මනා අවබෝධයක් තිබීම.
(4) තම රට පිළිබඳව යහපත් ප්‍රතිරූපයක් ඇති කිරීම.

**33. මානව හිමිකම් කඩවීමක් සම්බන්ධව ශ්‍රී ලාංකිකයන්ට පැමිණිලි කල හැකි ඉහළම ජාත්‍යන්තර ආයතනය වන්නේ,**

(1) එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම.
(2) ජාත්‍යන්තර අධිකරණය.
(3) ජාත්‍යන්තර කම්කරු සංවිධානය.
(4) එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය.

**34. සාර්ක් සංවිධානය ආරම්භ කල වර්ෂය වන්නේ,**

(1) 1975 (2) 1981 (3) 1995 (4) 1985

**35. සංවර්ධනය වන රටවල ලක්ෂන දෙකක් ඇතුලත් පිළිතුර තෝරන්න.**

(1) මානව සංවර්ධන දර්ශකය ඉහළ අගයක් ගන්නා අතර ඒකපුද්ගල ආදායම පහල
(2) තාක්ෂණය භාවිතය අඩුවන අතර භෞතික ජීවන තත්ව දර්ශකය ඉහළය.
(3) ජන සංඛ්‍යා වර්ධන වේගය අඩුවන අතර ප්‍රතිශීර්ෂ ආදායම ඉහලය.
(4) ළදරු මරණ අනුපාතිකය ඉහළ වන අතර මානව සංවර්ධන දර්ශකය පහළය.

**36. ලෝක සෞඛ්‍ය සංවිධානයේ අරමුණක් වන්නේ,**

(1) ග්‍රාමීය ජනතාවගේ පෝෂණය හා ජීවන මට්ටම ඉහල නැංවීමට.
(2) සරණාගතයින් සඳහා අන්තර්ජාතික ආරක්ෂාව සැපයීම.
(3) සාගින්න හා දරිද්‍රතාවය පිටු දැකීම.
(4) සැම කෙනෙකුටම හැකි ඉහළම සෞඛ්‍ය තත්වය අත්කර දීම.

**37. ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාව මුහුණ දී ඇති සෘණාත්මක බලපෑමක් වන්නේ,**

(1) බුද්ධි ගලනය වේගවත් වීම. (2) ආර්ථිකය විවිදාංගීකරණය වීම.
(3) නව තාක්ෂණය රටට ගලා ඒම. (4) සංචාරක කර්මාන්තය දියුණු වීම.

**38. සාර්ක් සංවිධානයට අලුතින්ම එක්වූ සාමාජික රට වන්නේ,**

(1) ඇෆ්ගනිස්ථානය (2) තජිකිස්ථානය
(3) මියන්මාරය (4) තායිලන්තය

**පහත දැක්වෙන්නේ ශ්‍රී ලංකාව බහු සංස්කීතික සමාජයක් වීමට තුඩු දුන් පුද්ගල සාදක සමූහයකි. ඒවා අධ්‍යනය කොට 39 හා 40 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A – **විජය කුමරු ඇතුළු පිරිස** B – **චන්ද්‍රභානු ඇතුළු පිරිස**
C – **පණ්ඩුවාසුදේව ඇතුළු පිරිස** D – **සේන - ගුත්තික ඇතුළු පිරිස**
E – **සංඝමිත්තා තෙරණිය ඇතුළු පිරිස** F – **පණ්ඩු - පාරින්ද ඇතුළු පිරිස**

**39. සංක්‍රමණ ස්වරූපයෙන් පැමිණි පිරිස දැක්වෙන පිළිතුර වන්නේ,**

(1) A B C (2) A C E (3) A D E (4) B C F

**40. ආක්‍රමණ ස්වරූපයෙන් පැමිණි පිරිස දැක්වෙන පිළිතුර වන්නේ,**

(1) A B C (2) A C D (3) B D F (4) D E F

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved



**අ.පො.ස (සා.පෙළ) විභාගය- 2023 (2024)**

**පෙරහුරු පරීක්ෂණය- පුරවැසි අධ්‍යාපනය i, ii**

**කාලය පැය 3 මිනිත්තු 10**

## පුරවැසි අධ්‍යාපනය II

**පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.

**පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්ණ **හතරක්** ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01.
- I. ප්‍රජාතන්ත්‍රවාදයේ ස්වරූප **දෙක** නම් කරන්න.
- II. සන්ධීය රාජ්‍යයක ලක්ෂණ **දෙකක්** නම් කරන්න.
- III. බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ **දෙකක්** නම් කරන්න.
- IV. ගෝලීයකරණය ලෝක ආර්ථිකයට කරන බලපෑම් **දෙකක්** සඳහන් කරන්න.
- V. සංවර්ධනය මැනීමේ සම්ප්‍රදායික මිනුම් **දෙකක්** ලියන්න.
- VI. අන්තර්ජාතික වෙළදාමේ ප්‍රධාන ස්වරූප දෙක ලියන්න.
- VII. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන වලට පැවරී ඇති කාර්‍යයන් ප්‍රධාන තේමා 03 ක් යටතේ දැක්විය හැක. ඉන් **දෙකක්** ලියන්න.
- VIII. ජාතික රාජ්‍යය බිහිවීමට බලපෑ සුවිශේෂී සාධක **දෙකක්** ලියන්න.
- IX. ශ්‍රී ලංකාවේ අධිකරණයේ ස්වාධීනතාවය ඇති කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුලත් කර ඇති ප්‍රතිපාදන **දෙකක්** ලියන්න.
- X. බලය විවිධ ස්වරූප වලින් පවතී. ඉන් ස්වරූප **දෙකක්** නම් කරන්න.

(ලකුණු 2 x 10 = 20)

02 සංස්කෘතික බහුවිධතාවෙන් යුතු සමාජයක් බහු සංස්කෘතික සමාජයක් ලෙස හඳුන්වනු ලබයි

- I. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපා ඇති සාධක **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)
- II. යහපාලනයේ මූලික ගුණාංග **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03)
- III. (a) බහු සංස්කෘතික සමාජයක ජනතාව එක්සත්ව කටයුතු කිරීමෙන් ලැබෙන වාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02)
  - (b) ඉන් එක් වාසියක් විස්තර කරන්න (ලකුණු 03)

03 යහපත් මානව ජීවිතයක් ගත කිරීම සඳහා මානව අයිකිවාසිකම් වැදගත් වේ

- I. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් විශ්ව ප්‍රකාශනයේ සදහන් එහි අරමුණු 02 ක් ලියන්න.. (ලකුණු 02)
- II. අන්තර් ජාතික මානව අයිතිවාසිකම් පනත නිර්මාණයවීමට බලපෑ ලේඛන (සම්මුතීන්) තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)
- III. (a) ශ්‍රී ලංකාව කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග **02 ක්** නම් කරන්න. (ලකුණු 02)
  - (b) කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ වැදගත්කම කෙටියෙන් විස්තර කරන්න

04 නූතන රාජ්‍යය බලය විමධ්‍යගත කිරීම හා බලය බෙදාහැරීම පිළිබඳ වැඩි උනන්දුවක් දක්වයි.

I නූතන රාජ්‍ය වල බලය බෙදා හැරීමට බලපෑ හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02)

II. පළාත් සභාවක ආණ්ඩුකාවරයා සතු බලතල සහ කාර්‍යයන් තුනක් ලියන්න. (ලකුණු 03)

III. (a) ඒකීය ආණ්ඩු ක්‍රමයක වාසි **02 ක්** නම් කරන්න. (ලකුණු 02)

(b) ඉන් එක් වාසියක් කෙටියෙන් විස්තර කරන්න (ලකුණු 03)

05 ශ්‍රී ලංකාවේ අතීතයේ සිට විවිධ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සිදුව ඇත.

I. ශ්‍රී ලංකාව තුළ යටත් විජිත සමයේ ඇති වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ **දෙකක්** ලියන්න. (ලකුණු 02)

II. ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන පිහිටුවීමට පදනම් වූ ආඥා පනත් **03** ලියන්න. (ලකුණු 03)

III. (a) පුරවැසියා කෙරෙහි ආණ්ඩුවේ විවිධ ස්ථරවල වගකීම් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)

(b) ඉන් එක් වගකීමක් විස්තර කරන්න (ලකුණු 03)

06 ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය වඩාත් යහපත් පාලන ක්‍රමයකි.

I. ග්‍රීසියේ ඇතැන්ස් පෞර රාජ්‍යයේ පැවති **පාලන ක්‍රමය** හා එහි ප්‍රධාන **පාලන ආයතනය** නම් කරන්න. (ලකුණු 02)

II. නිදහස් හා සාධාරණ මැතිවරණයක ලක්ෂණ **තුනක්** ලියන්න. (ලකුණු 03)

III. (a) ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක නිදහස් ජනමාධ්‍ය මගින් ඉටුකල යුතු කාර්යයන් **දෙකක්** ලියන්න (ලකුණු 02)

(b) ඉන් **එක්** කාර්යයක වැදගත්කම විස්තර කරන්න. (ලකුණු 03)

07 මනසේ සාමය නොමැතිවීම ගැටුම් ඇතිවීමේ ප්‍රධාන සාධකයකි.

I. ගැල්ටුන්ගේ ගැටුම් ත්‍රිකෝණයට අදාලව ගැටුමට සම්බන්ධ අවස්ථා **02 ක්** නම් කරන්න. (ලකුණු 02)

II. 'ගැටුම් ඇතිවීමට පුද්ගල මනස මුල් වේ' මනසේ සාමය ඇතිකර ගැනීමට යොමු වියහැකි අංශ **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

III. (a) ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රම **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)

(b) ඉන් එක් ක්‍රමයක් විස්තර කරන්න (ලකුණු 03)

**අ.පො.ස (සා.පෙළ) - 2023 (2024)**

**පිළිතුරු පත්‍රය**

**පුරවැසි අධ්‍යාපනය 1**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | (3) | 11 | (4) | 21 | (4) | 31 | (3) |
| 2 | (3) | 12 | (1) | 22 | (1) | 32 | (3) |
| 3 | (2) | 13 | (4) | 23 | (3) | 33 | (2) |
| 4 | (2) | 14 | (3) | 24 | (3) | 34 | (4) |
| 5 | (1) | 15 | (2) | 25 | (4) | 35 | (4) |
| 6 | (2) | 16 | (4) | 26 | (2) | 36 | (4) |
| 7 | (2) | 17 | (3) | 27 | (2) | 37 | (1) |
| 8 | (1) | 18 | (2) | 28 | (2) | 38 | (1) |
| 9 | (4) | 19 | (1) | 29 | (1.2,3,4) | 39 | (2) |
| 10 | (3) | 20 | (2) | 30 | (3) | 40 | (3) |

29 ප්‍රශ්ණයේ පිළිතුරුවල ගැටලුවක් ඇති බැවින් ලකුණු ලබා දෙන්න එහි දෙවන පිළිතුර ජලය නොව වැව ලෙස වෙනස් විය යුතුය

## අ.පො.ස (සා.පෙළ) -2023 (2024)

## පිළිතුරු පත්‍රය

## පුරවැසි අධ්‍යාපනය 2

01 i ඍජු ප්‍රජාතන්ත්‍රවාදය හා වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය

ii ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැවතීම

මධ්‍යම හා ප්‍රාන්ත අතර බලතල පැහැදිලිව ව්‍යවස්ථාව මගින් බෙදා තිබීම

ව්‍යවස්තාව අර්ථ නිරූපණය කිරීමේ බලතල ඉහළ අධිකරණයකට පැවරීම

ඉහළ මන්ත්‍රණ සභාවක් පිහිටා තිබීම

iii විවිධ ජනවර්ග විවිධ ආගමික විශ්වාස දරන විවිධ භාෂා කතා කරන පුද්ගලයින් එකට ජීවත්වීම

ඒ ඒ සංස්කෘතීන්ට ආවේණික සිරිත් විරිත් ආචාර ධර්ම හා ඇගයීම් පද්ධතියක් තිබීම

එක ජන කොටසක වුවද ප්‍රාදේශීය විවිධත්වයක් දැකිය හැකි වීම

iv බහු ජාතික සමාගම් බිහිවීම

විවෘත ආර්ථික ප්‍රතිපත්තිය ලෝකයට හඳුන්වා දීම

දේශීය මුදල් විදේශ වලට ඇදී යාම

ශ්‍රම හා ප්‍රාග්ධන සචලතා

ත්‍රෛලෝක නිෂ්පාදන මත ආර්ථික කටයුතු සිදුවීම ආදී

v දළ ජාතික නිෂ්පාදනය

ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදනය

මූර්ත දළ ජාතික නිෂ්පාදනය

ආර්ථික වර්ධන වේගය

vi ද්වි පාර්ශවික වෙළදාම හා බහු පාර්ශවික වෙළදාම

vii පොදු මංමාවත්

මහජන සෞඛ්‍ය

පොදු උපයෝගිතා සේවා

viii රෙපරමාදු ආගමික ප්‍රතිසංස්කරණ

පුනරුදය

වැඩවසම් ක්‍රමය බිඳ වැටීම

විද්‍යාත්මක දැනුම වර්ධනය

ix විනිශ්චයකාරවරුන් පත් කිරීම

විනිශ්චයකාරවරුන් ඉවත් කිරීම

විනිශ්චයකාරවරුන්ගේ වැටුප්

වෙනත් තනතුරු පිළිගැනීම

x දේශපාලන බලය, පරිපාලන බලය, සමාජ බලය, ආර්ථික බලය

02 i පිටුව 62 (10 වසර)

ii පිටුව 64 (10 වසර)

iii පිටුව 67 (10 වසර)

03 i පිටුව 50 (11 වසර)

ii පිටුව 56 (11 වසර)

iii පිටුව 57 58 59 (11 වසර)

04 i පිටුව 37 (10 වසර)

ii පිටුව 48 (10 වසර)

iii පිටුව 42 (10 වසර)

05 i පිටුව 25 26 27 (11 වසර)

ii පිටුව 38 39 (11 වසර)

iii පිටුව 42 (11 වසර)

06 i පිටුව 02 (10 වසර)

ii පිටුව 10 11 ( 10 වසර)

iii පිටුව 15 (10 වසර)

07 i පිටුව 93 (10 වසර)

ii පිටුව 92 (10 වසර)

iii පිටුව 99 100 101 102